ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2019-02-15


පැමිණිලි පාර්ශවය : ඒ.ඒ.පී. උපේන්ද්‍ර මයා,
113, ගාලු පාර,
බම්බලපිටිය,
කොළඹ 04.

වගඋත්තරකාර පාර්ශවය : 01 ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

02 විදුහල්පති,
රාජකීය විද්‍යාලය,
කොළඹ 07.

පැමිණිලි අංකය : HRC//3578/17

පැමිණිලිකරුගේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිලිකරු විසින් 2017-11-21 වන දිනැතිව සිය පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම දරුවා 2018 වර්ෂයේ කොළඹ රාජකීය විද්‍යාලයේ පළමු වසරට ඇතුළත් කිරීමේ අරමුණින් සහෝදර පදනම යටතේ S/18/4004 හා ආසන්නතා පදනම යටතේ S/18/6069 අයදුම් පත්‍ර 02ක් යොමු කළ බවත්, සම්මුඛ පරීක්ෂණයට කැඳවා බඳු ඔප්පුව ලියාපදිංචි වී නොමැති නිසා ඔහුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් හා අභියාචනා කමිටුව විසින් ලකුණු ලබා නොදී ඉවත් කරන ලද බවත්ය. නමුත් තමා හට පදිංචිය සනාථ කිරීම සඳහා වන අනෙකුත් ලේඛන සියල්ල පවතින බවත්, ඒ අනුව




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575, 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

වගඋත්තර පාර්ශවය විසින් තමාට අසාධාරණයක් සිදු කර ඇති බවත් පැමිණිලිකරු සිය පැමිණිල්ල මගින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට කරුණු ඉදිරිපත් කරමින් දන්වා ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිල්ලට අදාළ පරීක්ෂණය 2017-02-07 වන දින සිදු කර ඇති අතර, එහිදී කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තරකාර පාර්ශවය සඳහන් කර ඇත්තේ, මෙම පැමිණිලිකරු ආසන්නතාවය හා සහෝදර පදනම මත අයදුම් පත්‍ර 02ක් ඉදිරිපත් කර ඇති බවත්, මෙම පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරනලද බදු ඔප්පුව ලියාපදිංචි නොවීම මත කිසිදු ලකුණක් ලබා නොදී අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කළ බවත්, ඒ අනුව ලකුණු ලබා දීමට හැකියාවක් නොමැති බවත් වගඋත්තරකරුවන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට කරුණු දක්වා ඇත.

කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු :-

පැමිණිලිකරු ආසන්නතා පදනම සහ සහෝදර පදනම මත අයදුම් පත්‍ර 02ක් ඉදිරිපත් කර ඇත. තවද පැමිණිලිකරු ඡන්ද නාම ලේඛනයේ 2009 වර්ෂයේ සිට ලියාපදිංචි වී ඇති බවත්, ළමයාගේ උප්පැන්න සහතිකය, පැමිණිලිකරුගේ විවාහ සහතිකය, දරුවාගේ සෞඛ්‍ය වර්ධන කාඩ්පත, ජාතික හැඳුනුම්පත්, බැංකු රක්ෂණය, දුරකථන බිල්පත් ද 2007 වසරේ සිට ලියාපදිංචි නොකළ බදු ඔප්පුවක්ද ඉදිරිපත් කර ඇති බවත් නිරීක්ෂණය වේ. එසේම පැමිණිලිකරුගේ වැඩිමහල් දරුවා එම විද්‍යාලයේ 03 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන අතර, එම දරුවා පාසලට ඇතුළත් කිරීම සඳහාද ඉදිරිපත් කරන ලද ඉහත ලේඛන 2018 වර්ෂයේ තම දෙවන දරුවාට ඉදිරිපත් කර ඇති බවත්, පැමිණිලිකරුගේ ප්‍රකාශ වලින් පැහැදිලි වේ.

2017-09-19 වන දින දාතමින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කර ඇති 22/2017 චක්‍රලේඛයේ අදාළ ගණයන් හය සඳහා මූලික සුදුසුකම් හඳුන්වා දීමෙන් අනතුරුව ඒ ඒ ගණයට අදාළ ලකුණු පටිපාටිය දක්වා ඇත. යම් අයදුම්කරුවකු එම මූලික සුදුසුකම් සපුරා නොමැති නම් පමණක් අදාළ ගණයට හිමිකම් නොලබයි. එහෙත්, නියමිත මූලික සුදුසකම් සපුරා ඇත්නම්, ලකුණු පටිපාටියේ එක් කොටසක් තහවුරු නොකිරීම මත සම්පූර්ණයෙන් ලකුණු ලබා දීම ප්‍රතික්ෂේප නොකළ යුතුය හා විශේෂයෙන්ම, පාසලට අසාන්න පදිංචිකරුවන්ගේ දරුවන්ගේ ගණය යටතේ මූලික සුදුසුකම වනුයේ පෝෂිත ප්‍රදේශය තුළ පදංචි වී සිටීම වන බවද දක්වා ඇත. පදිංචිය තහවුරු කරන ලේඛන යටතේ වන පදිංචි ස්ථානයේ හිමිකම යන්න ලකුණු පටිපාටියේ අන්තර්ගත එක් නිර්ණායකයක් පමණක් වන අතර, එම චක්‍රලේඛයේ 9.3.3

උපවගන්තිය සම්බන්ධයෙන් අවධානය යොමු කර තවදුරටත් සත්‍ය පදංචිය තහවුරු කර ගත හැක යනුවෙන් සදහන් කර ඇත.

ඒ අනුව පැමිණිලිකරු ආසන්න පදනම සහ සහෝදර පදනම මත ඉල්ලුම් කර ඇති බවත්, ආසන්නතා පදනම යටතේ පාසලට ළමුන් ඇතුලත් කිරිමේ අවම ලකුණු සීමාව 52ක් වන අතර, සහෝදර පදනම යටතේ පාසලට ළමුන් ඇතුලත් කිරිමේ අවම ලකුණු සීමාව 28ක් බවත්, නිරීක්‍ෂණය වේ. පැමිණිලිකරුට ආසන්නතා පදනම හා සහෝදර පදනම යටතේ අවම ලකුණු සීමාව ඉක්මවා ලකුණු ලබා ගැනිමට හැකියාවක් ඇති බවට ඉදිරිපත් කර ඇති ලේඛන අනුව තහවුරු වේ.

පැමිණිලිකරුට ආසන්නතා පදනම මත ජන්ද නාම ලේඛනයට ලකුණු 30ක්ද, අමතර ලේඛන සඳහා ලකුණු 05ක්ද, පදිංචිය සඳහා ලකුණු 50ක්ද හිමි වන බව නිරික්ෂණය වන අතර, ඒ අනුව මුළු ලකුණු 85ක් ලබා ගැනිමට හැකියාවක් ඇති බව නිරික්ෂණය වේ. ආසන්නතා පදනම මත පාසලට ළමුන් ඇතුලත් කිරිමේ අවම ලකුණු සීමාව ලකුණු 52 වන අතර, පැමිණිලිකරුට එම සීමාව ඉක්මවා ලකුණු ලබා ගැනිමේ හැකියාව ඇති බව නිරීක්‍ෂණය වේ. තවද සහෝදර පදනම මත තම වැඩිමහල් පුත්‍රයා ඉගෙනුම ලබන 03 වන ශ්‍රේණිය සඳහා ලකුණු 15ක්ද, පදිංචිය සඳහා ලකුණු 30ක්ද වශයෙන් සහෝදර පදනම යටතේද මුළු ලකුණු 45ක් උපයා ගැනිමට හැකියාව තිබූ බවට නිරික්ෂණය වන බැවින් සහෝදර පදනම යටතේද අවම ලකුණු සීමාව ඉක්මවා ලකුණු ලබා ගැනීමේ හැකියාව තිබී ඇති බවද තහවුරු වේ. නමුත් අභියාචනා පරික්ෂණ අවස්ථාවේදී හෝ ඒ සම්බන්ධයෙන් සලකා බලා නොමැති බවද නිරික්ෂණය වේ.

නිගමනය :-

ඒ අනුව පාර්ශවයන් ඉදිරිපත් කර ඇති ඉහත සියලු ලිඛිත හා වාචික කරුණු සලකා බැලීමෙන් පසු කොළඹ රාජකීය විද්‍යාලයේ සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලය සහ අභියාචනා පරික්ෂණ මණ්ඩලය විසින් චක්‍රලේඛ උල්ලංඝනය කරමින් කටයුතු කර ඇති බවත්, එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයෙන් වගඋත්තරකරුවන් ක්‍රියා කර ඇති බවත් මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකරුගේ දරුවා වන ජේ.ජේ.වයි. සත්මිර දරුවා රාජකීය විද්‍යාලයේ 2019 වසරේ දෙවන ශ්‍රේණියට ඇතුලත් කර ගන්නා ලෙසට මෙයින් දන්වා සිටිමි.

2019. 03. 18 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- 1. ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

B/